

ශ්‍රේණිය

ගණිතය

## ඉගෙනුම් අඛණ්ඩතාව පවත්වා ගැනීමේ වැඩසටහන





# ගුරු උපදේශ සංග්‍රහය

unicef
for every child

අනුග්‍රහය : යුනිසෙෆ්

ඌව සහ මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ඒකාබද්ධ ව්‍යාපෘතියකි.

**උපදේශකත්වය** : **එච්. එම්. නන්දසේන මයා**
**ඌව පළාත් අධ්‍යාපන ලේකම්**

**අධීක්ෂණය** : **ඩී. එම්. රත්නායක මයා**
**ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ**

**සම්බන්ධීකරණය** : **ආර්. එම්. ආනන්ද මයා**
**අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ**

**මෙහෙයවීම** : **බී. එම්. යූ. බී. බස්නායක මයා**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ**

**ව්‍යාපෘති සම්බන්ධීකාරක :** **සුගත් අධිකාරම් මයා**

**සම්පත් දායකත්වය**

එස්. ඒ. අයි. පෙරේරා මිය - ගුරු උපදේශක (ප්‍රාථමික) කලාප අධ්‍යාපන කාර්යාලය, බණ්ඩාරවෙල

ඩී. එම්. කුසුමාවතී මිය - ගුරු උපදේශක (ප්‍රාථමික) කලාප අධ්‍යාපන කාර්යාලය, බදුල්ල

කේ. දේවි රාණි මිය - ගුරු උපදේශක (ප්‍රාථමික) කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පස්සර

ඩී. එම්. එල්. දිසානායක මිය - ගුරු සේවය - බ/කැන්දගොල්ල ප්‍රාථමික විද්‍යාලය, බදුල්ල

ජී. ප්‍රදීපා මිය - ගුරු සේවය - බ/ගෝනකැලේ දෙමළ ප්‍රාථමික විද්‍යාලය, පස්සර

**පිටකවරය සැකසීම** : එච්. එම්. සමන් කුමාර මයා - ගුරු සේවය
බ/සේරාණ ප්‍රාථමික විද්‍යාලය, මහියංගණය

**යතුරු ලියනය** : එච්. එම්. සමන් කුමාර මයා - ගුරු සේවය
බ/සේරාණ ප්‍රාථමික විද්‍යාලය, මහියංගණය
ඩී. එම්. ආර්. එම්. ලක්මාල් මයා - ගුරු සේවය
බ/සූරියගොල්ල විද්‍යාලය, පිටමාරුව
ඕ. අයි. සම්පත් මයා - ගුරු සේවය
මො/රතඹලාගම කනිෂ්ඨ විද්‍යාලය, තණමල්විල
ජී. අරුපුදරාජ් මයා - ගුරු සේවය
බ/විග්නේෂ්වරා දෙමළ විද්‍යාලය, පස්සර

**ප්‍රථම මුද්‍රණය** : 2022

**විවිධ සහය :**

ඒ.ඩී.ඉ.ඒ.විජේසිංහ මයා - ( සංවර්ධන නිලධාරි) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ආර්.එම්.එන්.ඩී. ජසින්තානි මිය - ( සංවර්ධන නිලධාරි) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ඩී. ඩී.එස්.මධුමති මිය - ( සංවර්ධන නිලධාරි) ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව





## ප්‍රාථමික දරුවන්ගේ ඉගෙනුම් අඛණ්ඩතාව පවත්වාගෙන යාමේ වැඩසටහන

## යුනිසෙෆ් ව්‍යාපෘතිය

ඌව හා මධ්‍යම පළාත් ඒකාබද්ධ ව යුනිසෙෆ් ව්‍යාපෘතියේ දායකත්වයෙන් ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන ඉතා සාර්ථක අන්දමින් පළාත් තුළ ක්‍රියාත්මක කර, දූවා දරුවන්ගේ අනාගත සිහින සැබෑ කිරීමට ඉතා ඵලදායී වැඩසටහනක් වේවා! යි අපි ප්‍රාර්ථනා කරන්නෙමු.

මෙම වැඩසටහන සඳහා උපදේශකත්වය සැපයූ පළාත් 02හි පළාත් අධ්‍යාපන ලේකම්වරුන්, පළාත් 02හි අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් දෙපල ද, යුනිසෙෆ් විෂය භාරව කටයුතු කරන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දෙපල ද, මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කළ පළාත් 02හි සම්පත්දායකත්වය සැපයූ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන්, ගුරුවරුන් හා යුනිසෙෆ් ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරි සුගත් අදිකාරම් මහතා වෙත විශේෂ ස්තුතිය පිරිනමන්නෙමු.

ක්‍රියාකාරකම් පාදක කොට ගෙන දරුවකුට ලැබෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් දරුවන්ගේ බුද්ධි වර්ධනය, ගුණාත්මක ආකල්පමය සංවර්ධනය ද, සන්නිවේදන කුසලතා සංවර්ධනය ද, නිර්මාණශීලී චිත්තවේගයන් මෙන්ම එයට බලපාන, නැති නම් එයට හේතුවන ඉන්ද්‍රීය සමායෝජනය හා ඒ තුළින් පරිකල්පන ශක්තියෙහි වර්ධනයට ද හේතු පාදක වනු ඇත. මෙම මොඩියුලය නිර්මාණය කිරීමේ දී ද දරුවාට ප්‍රියජනක අන්දමින් ඉගෙනීමටත්, ක්‍රියාකාරකම් පාදක ව දරුවා අදාළ අවධිය තුළ සාධනය කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සාධනය කර දීමටත් මෙමගින් ගෙන ඇති උත්සාහය අපි අගය කරන්නෙමු.

සෑම දරුවකුගේ ම අධ්‍යාපන අඛණ්ඩතාව පවත්වාගෙන යමින් ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රශස්ත සංවධර්නයක් ඇති කරලීමට ද, ප්‍රාථමික අධ්‍යාපන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කරලීම සඳහා ද, මෙම ක්‍රියාකාරකම් සංග්‍රහවලින් උපරිම පලය දරුවාට අත්කර දීම සඳහා වගකීමෙන් හා වගවීමෙන් කටයුතු කරනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු.

**එම්. ජී. අමරසිරි පියදාස**
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ඩී. එම්. රත්නායක**
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# ප්‍රාථමික දරුවන්ගේ ඉගෙනුම් අඛණ්ඩතාව පවත්වාගෙන යාමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ උපදෙස්මාලාව

- ඌව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව,මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව ඒකාබද්ධව සකස් කරන ලද පළාතේ සියලු ම පාසල්වල 1 ශ්‍රේණියේ සිට 4 වන ශ්‍රේණිය දක්වා වන පන්තිවල ඉගෙනුම ලබන සියලු ම සිසු දරුවන්ගේ ගණිතය සහ භාෂාව යන විෂයන්වල ක්‍රමානුකූල සංවර්ධනය ඉලක්ක කරගනිමින් සකස් කරන ලද ඉගෙනුම් ක්‍රියාකාරකම් සංග්‍රහය මේ සමඟ පළාතේ සියලු පාසල්වල විදුහල්පතිවරු මගින් අදාළ ශ්‍රේණිවල ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරු සඳහා මේ සමඟ ලබාදීමට කටයුතු කරනු ලැබේ.

- මෙම ඉගෙනුම් සංග්‍රහයන් සකස් කරන ලද්දේ පළාත් දෙකේම විෂයභාර අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන් හා ප්‍රවීණ ම ගුරුවරුන් මඟිනි. එසේම මෙය විෂය නිදෙර්ශයට අනුකූලව සකසා ඇත.

- ශිෂ්‍යයන්ගේ ඉගෙනුම සඳහා සකස් කරන ලද ක්‍රියාකාරකම් අත්පොත සෑම සිසුවකු වෙතම ලබා දීමට කටයුතු කළ යුතුය. එසේම ගුරුවරුන් සඳහා සකස් කරන ලද උපදෙස් සහිත ක්‍රියාකාරකම් සංග්‍රහය අදාළ පන්ති වල උගන්වන සෑම ගුරුවරයෙකු වෙතම ලබා දීමට කටයුතු කළ යුතු ය.

- ගුරුවරු විසින් ක්‍රියාකාරකම් සංග්‍රහය ඉතා මැනවින් පරිශීලනය කොට අදාළ ඉගැන්වීම සඳහා සූදානම් විය යුතු ය. අවශ්‍ය ඉගෙනුම් උපකරණ මනා ලෙස සංවිධානය කරගත යුතු ය.


- මෙම වැඩසටහන සකසා ඇත්තේ ක්‍රියාකාරකම් පාදක ව ඉතා සතුටින් සිසුන්ට අධ්‍යාපනය හැදෑරීමටත්,වඩාත් ප්‍රියජනක ව ඉගැන්වීම් කටයුතු කිරීමටත් හැකිවන වන පරිද්දෙන් ය . ඉගෙනුම් දුෂ්කරතා ඇති දරුවන්ට වඩාත් පහසුවෙන් එම කරුණු තහවුරු කර ගැනීමට හැකි වන පරිදි ක්‍රියාකාරකම් සකසා ඇත.

- වඩාත් වැදගත් වන්නේ මෙම ඉගෙනුම් සංග්‍රහය තුළින් සිසුන්ගේ බහුවිධ දක්ෂතාවයන් වර්ධනය කිරීමට අවකාශ සලසා දීම ය. ගතානුගතික සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමයන් වන ප්‍රශ්න පත්‍ර ලබා දීම වැනි කාරණාවලින් මැනිය හැක්කේ සිසුන්ගේ දැනුම පමණි. එබැවින් හැකි සෑම විටම පන්තියට පිවිසෙන ගුරුවරයා විසින් සූදානම් කර ගන්නා ලද ඉගෙනුම් උපකරණ සමග මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් කරුණකි. එමෙන් ම සිසුන් තක්සේරු කිරීමේ ක්‍රමය ද හොඳින් ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව ද මේ මගින් ම ඉටුකරගැනීම තුළින් අනාගතයේ දී වඩාත් ශක්තිමත් සිසු පිරිසක් ද්විතියික අධ්‍යාපනයට ප්‍රවිෂ්ට කිරීමට මෙමගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන කරුණකි.

- මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ සතියකට දින දෙකක් පාසල් වේලාවෙන් අනතුරු ව අමතර කාලයක් යොදා ගෙන ය.සාම්ප්‍රදායික පන්ති කාමරය යන සංකල්පයෙන් ඔබ්බට යමින් වඩාත් ප්‍රියජනක ස්ථානයක් මේ සඳහා යොදා ගැනීම වඩාත් සුදුසු ය. ප්‍රාථමික ළමා ක්‍රියාකරකම් ඒකකය වැනි ස්ථාන මේ සඳහා භාවිතයට ගැනීම ද වඩාත් සුදුසුය .සෑම විට ම මෙම වැඩසටහන නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම විදුහල්පතිවරයාගේ මූලික වගකීමක් වන්නේය. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ යන අයගේ සෘජු අධීක්ෂණය ද මේ සඳහා
අනිවාර් යයෙන් ම යොමු කළ යුතු ය.


- ශක්තිමත් ප්‍රාථමික අධ්‍යාපනයක් තුළින් ඉතා යහපත් සමාජයක් අනිවායෙර්න්ම ගොඩනගාගත හැකි ය. එබැවින් මෙම සත්කාරය උපරිමයෙන් ඉෂ්ට කර ගැනීමට ඔබ සැමගේ සහය අපේක්ෂා කරමු.


| ක්‍රියාකාරකම අංක - 01 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | පූර්ව ගණිත සංකල්පවලට අදාළ ක්‍රියාකාරකම්හි නිරත වෙයි. |
| 03. ඉගෙනුම් පල | ද්‍රව්‍ය රූප කට්ටල වරකට එක් උප ලක්ෂණයක් අනුව පාට හා තරම ගොඩවලට වෙන් කරයි.<br>විවිධ පාටින් යුත් ද්‍රව්‍ය කට්ටලයක් පාට අනුව ගොඩවලට වෙන් කරයි. |
| 04. ඉගෙනුම් සම්පත් | එකම හැඩයෙන්, එකම ප්‍රමාණයෙන් රතු, කහ, නිල් පාටින් යුතු මල් 15ක් කණ්ඩායම් ගණනට අවශ්‍ය වට්ටි තුන බැගින්, කතුරක් |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකාරකම 01 | • වර්ණ තුනකින් සකසා ගත් කඩදාසි මල් සපයා ගන්න.<br>• කණ්ඩායමට තුන බැගින් හිස් මල් වට්ටි සපයා ගන්න.<br>• කණ්ඩායම්වලට අදාළ මල් වට්ටිය බැගින් ලබා දෙන්න.<br>• එම මල් වට්ටි ඇසුරින් සුහද කතාබහක යෙදෙන්න.<br>• වට්ටිවල ඇති මල් ළමුන් කැමති ආකාරයට වෙන් කර ලබා දී ඇති බඳුනට වෙන් කරන්න.<br>• වෙන් කළ ආකාරය පිළිබඳව සාකච්ඡා කරන්න.<br>• කණ්ඩායම් සියල්ල මල් වෙන් කළ ආකාරය සෙසු කණ්ඩායම්වලට නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දී, සාකච්ඡා කරන්න.<br>• නැවත මල් සියල්ල එක්කර ගුරුතුමියගේ උපදෙස් මත බඳුන්වලට වෙන් කරන්න.<br>• නැවතත් පෙර සේ මල් එක බඳුනකට දමා ගුරුතුමිය දෙන සංඥාවකට අනුව පළමුව පාට අනුව වෙන් කරන කණ්ඩායමට ප්‍රීති ඝෝෂා වක් පවත්වන්න. මෙම ගීතය ගායනා කරන්න.<br>*රතු පාටින් මල් ගොඩයි.*<br>*නිල් පාටින් මල් ගොඩයි.*<br>*කහපාටින් වෙන් කළාම.*<br>*පාට අනුව මල් ගොඩයි.*<br>• දෙන ලද මල් සහිත තීරුව වර්ණ තුනකින් වර්ණ ගැන්වීමට යොමු කරන්න.<br>• වර්ණ කළ පසු මල් ගලවා, කපා වෙන්කොට ගෙන දී ඇති බඳුන්වලට වර්ණ අනුව වෙන් කරවන්න. |


| ක්‍රියාකාරකම අංක - 02 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | ද්‍රව්‍ය/ රූප කට්ටල දෙකක් එකට එක ගළපයි. (එකට එක අනුරූපව) |
| 03. ඉගෙනුම් පල | නිතැතින්ම ගැළපෙන ද්‍රව්‍ය /රූප කට්ටල දෙකක් එකට එක අනුරූපව ගළපා සංසන්දනය කරයි. එකිනෙකට නොගැළපෙන ද්‍රව්‍ය රූප කට්ටල දෙකක් එකට එක ගළපා සංසන්දනය කරයි. |
| 04.ඉගෙනුම් සම්පත් | පොල් කටුව, සෑම පිරිමි ළමයෙකුට හා ගැහැනු ළමයෙකුට ම කමිසයක්, කැන්ද කොළ, කෙසෙල් කොළ හෝ සුදුසු කොළයක් |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකාරකම 01 | • රෙදි වැලක් සාදා සියලු ම ගැහැනු ළමුන්ගේ හා පිරිමි ළමුන්ගේ ඇඳුම් රෙදි වැලෙහි රඳවන්න.<br>• මීටර් පහක් පමණ දුරින් ගැහැනු ළමුන් එක පෙළට සිටුවා, ගුරුවරයාගේ විධානයට අනුව ඇවිදගෙන ගොස් තමාගේ ඇඳුම තෝරා ඇඟලාගෙන නැවත තමන් සිටි ස්ථානය වෙත පැමිණීමට යොමු කරන්න.<br>• (ළමුන් සංඛ්‍යාව අනුව වාර ගණන තීරණය කරන්න.)<br>• ලබා ගත් ඇඳුම් පිළිබඳව හා සාකච්ඡාවක් කරන්න.<br>මෙහි දී,<br>සෑම ළමයෙකුටම ඇඳුමක් තිබේ ද?<br>ඇඳුම් වැඩි ද?<br>ළමුන් වැඩි ද?<br>සෑම දරුවෙකු ම නියමිත ඇඳුම ලබා ගත්තේ ද? |
| ක්‍රියාකාරකම 02 | • සෑම දරුවෙකුට ම කෝම්පිට්ටුවක් සෑදීම සඳහා සුදුසු පස් ටිකක් සහ පොල් කටුවක් ගෙන්වා ගන්න.<br>• ගෙනෙන ලද පස් සහ පොල් කටුව උපයෝගී කරග නිමින් කෝම් පිට්ටු සාදවන්න.<br>• කෝම් පිට්ටු සෑදීමේ දී''කෝම්පිට්ටු ඉදීයන්'' ගීතය ගායනා කරන්න.<br>• ළමුන් ගීතය ගායනා කරන අතරේ දී ගුරුතුමිය කැන්ද කොළ පේළියට තබන්න. (මෙහිදී කැන්ද කොළ කෝම් පිට්ටු ප්‍රමාණයට වඩා වැඩියෙන් තබන්න.)<br>• සිසුන් සැකසූ කෝම් පිට්ටු කැන්ද කොළය මත තැබීමට යොමු කරන්න.<br>• කොම්පිට්ටු ප්‍රමාණයට කැන්ද කොළ තිබේ ද?.<br>• සෑම කැන්ද කොළයකට ම කෝම් පිට්ටු තිබේ ද? |
| තක්සේරුව | සිසු අත්පොතේ සෑම ළමයෙකුට ම ඇඳුම බැගින් යා කිරීමට යොමු කරන්න. |
| <br>නිවසේ දී | • ගෙදර ඇති සපත්තු හා මේස් සපයා ගන්න.<br>• සපත්තුවට මේස් තිබේ ද? යන්න සංසන්දනය කරන්න.<br>• තම කාමරයට ගොස් පොත් මේසේ ඇති පොත් හා පැන්සල් ළඟට ගෙන ඒවා එකට එක ගැළපීමට යොමු කරන්න.<br>• කුස්සියට ගොස් පීරිසි කෝප්ප හා පීරිසි කීපයක් ගන්න.<br>• ඒවා එකට එක ගළපා, අඩු ද? වැඩි ද? යන්න තහවුරු කර ගන්න.<br>• ගළපන ලද කැමති එකක් චිත්‍රයට නඟන්න. |

| ක්‍රියාකාරකම අංක - 04 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | එකම හැඩයේ, එකම වර්ගයේ ද්‍රවය 3ක් තරම අනුව පටිපාටි ගත කරයි.<br>තරම වෙනස් එකම වර්ගයේ සමාන රූප සහිත පත්‍රිකා තුනක ඇති රූප තරම අනුව පටිපාටිගත කරයි. |
| 03. ඉගෙනුම් පල | එකම හැඩයේ, එකම වර්ගය ද්‍රව්‍ය 3 විශාලත්වය, තරම අනුව කුඩා ම, ටිකක් ලොකු සහ ලොකු ම ද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් දක්වයි.<br>එකම හැඩයේ එකම වර්ගයේ ද්‍රව්‍ය තුනක් කුඩා ම ද්‍රව්‍යයේ සිට විශාල ම ද්‍රව්‍යය තෙක් පටිපාටියට තබයි.<br>එකම හැඩයේ එකම වර්ගයක ද්‍රව්‍ය 3ක් විශාල ම ද්‍රව්‍ය සිට කුඩා ම ද්‍රව්‍ය තෙක් පටිපාටියට තබයි. |
| 04. ඉගෙනුම් සම්පත් | වලස් පියා, මව, පුතා රූප (3x3)<br>ලොකු, තරමක් ලොකු, කුඩා කෝප්ප (3x3)<br>ලොකු, තරමක් ලොකු, කුඩා ඇඳන් (3x3)<br>ලොකු, තරමක් ලොකු, කුඩා පුටු (3x3) රූප ------සකස්කර ගන්න. |
| 05. ක්‍රියාවලිය<br>පියවර 01 | • කතන්දරය කියන්න.<br>• අදාළ පත්‍රිකා බෙදා දෙන්න.<br>• රූප පිළිබඳව කතා කරන්න.<br>• ගුරුතුමිය විසින් ගීතය ගායනා කරන්න.<br><br>ළමයා නැග්ග කන්ද //<br>මොනව ද දැක්කේ ?<br>කන්ද එහා පැත්තේ................///<br>කැලයයි දැක්කේ...................<br><br>• සියලු ළමුන් ගායනා කරද්දී ඉන් එක් ළමයෙකු රවුමට ගමන් කරවන්න.<br>• ගීතය නවත්වා ළමුන් වාඩි කරවා කතන්දරය ඇසීමට යොමු කරන්න.<br>• කතන්දරය කියා අවසන් වනතුරු සියලු ම රූප අදාළ අවස්ථාවේ දී පෙන්වන්න.<br>• කතන්දරය අවසන් වූ පසුව ඒ ඒ රූප පිළිවෙළට තැබීමට යොමු කරන්න.<br>• පෙන්වන ලද ස්ථානවල රූප පිළිවෙළට තබන්න.<br>• එක් වර්ගයක් ඇසුරින් ආරෝහණ හා අවරෝහණ පිළිවෙළට රූප තබා ආදර්ශනය කර පෙන්වන්න.<br>• කණ්ඩායම් 4 කට සිසුන් වෙන්කර රූප කට්ටල 4 ලබා දෙන්න.<br>• රූප කට්ටල ආරෝහණ ක්‍රමයට හා අවරෝහණ ක්‍රමයට සකස් කිරීමට ගුරුතුමිය විසින් අවශ්‍ය උපදෙස් ලබා දෙන්න. |


| | |
|---|---|
| පියවර 02 | • සෑම දරුවෙකුට ම කෝම් පිට්ටුවක් සෑදීම සඳහා සුදුසු පස් ටිකක් සහ පොල් කටුවක් ගෙන්වා ගන්න.<br>• ගෙන ලද පස් සහ පොල් කටුව උපයෝගී කරගනිමින් කෝම් පිට්ටු සාදවන්න.<br>• කෝම් පිට්ටු සෑදීමේ දී ''කෝම්පිට්ටු ඉදීයන්'' ගීතය ගායනා කරන්න.<br>• ළමුන් ගීතය ගායනා කරන අතරේ දී ගුරුතුමිය කැන්ද කොළ පේළියට තබන්න.<br>(මෙහි දී කැන්ද කොළ කෝම් පිට්ටු ප්‍රමාණයට වඩා වැඩියෙන් තබන්න.)<br>සිසුන් සැකසූ කෝම් පිට්ටු කැන්ද කොළය මත තැබීමට යොමු කරන්න.<br>කෝම් පිට්ටු ප්‍රමාණයට කැන්ද කොළ තිබේ ද?<br>සෑම කැන්ද කොළයකට ම කෝම් පිට්ටු තිබේ ද? |
| | කතාන්දරය<br>එක ගමක ගෙදරක, ලස්සන ගෑනු ළමයෙක් හිටියා. එයාට ලස්සන පොකුටු කොණ්ඩයක් තිබුණා. එයා කොහොම ද ලස්සන වුණේ? මැල්ලුම් වර්ග, පලතුරු වර්ග කන්න එයා ගොඩක් කැමති කෙනෙක් නිසා.<br>ඒ නිසා එයාට "කුණ්ඩලකේෂී" කියලා නමක් දාලා තිබුණා.<br>ඉතින් දවසක් දා එයා මල් කුඩයක් අරගෙන ලස්සන මල් හොයාගෙන වත්තේ පහළට ගියා. එහෙම ලස්සන මල් බලමින් යනකොට නොදැනුවත්ව ම එයා වත්තෙන් ඈතට ම ගිහින් තිබුණා.<br>කුණ්ඩලකේෂී කැලයේ අතරමං වුණා. ආපසු ගෙදර එන පාර හොයාගන්න වටපිට බලනකොට, පුංචි පාරක් විතරයි එයා දැක්කේ. වෙන කරන්න දෙයක් නෑ. කුණ්ඩලකේෂී එම පාර දිගේ යන්න ගියා. මේ පාර ඉවර වුණේ කැලේ තිබුණ ලස්සන ලොකු ගෙදර මිදුලෙන්.<br>ගෙදර දොර වහලා තිබුණා. කුණ්ඩලකේෂී ගෙදර දොරට අත ලැබුවා විතරයි දොර ඇරුණා. ඇතුළට ගිය කුණ්ඩලකේෂී වටපිට බැලුවා. ගෙදර කවුරුත් නැහැ. ඈ හෙමින් ඇතුළට යනකොට මේසයක් උඩ කෝප්ප තුනක් තිබුණා. ඒවාට කැඳ දාලා වහලා තිබුණා.<br>ඇයට බඩගින්නක් දැනුණා. මේ ගෙදර ඉන්නේ වලස් පවුලක්. ඒ පවුලේ ඉන්නේ වලස් අම්මයි, වලස් තාත්තයි, වලස් බබයි. මේ අය කැඳ හදලා ඒවා නිවෙන්න තියලා ඇවිදින්න ගිහින් තිබුණා.<br>ඉතින් කුණ්ඩලකේෂී තාත්තගේ කෝප්පයෙන් ටිකක් බීලා බැලුවා. ඒක හොඳට ම රස්නෙයි. බොන්න බැහැ. ඊට පස්සේ අම්මාගේ කැඳ කෝප්පය බීලා බැලුවා. ඒක හොඳට ම සීතලයි. බොන්න බැහැ. ඊළඟට බබාගේ කැඳ කොප්පය බීල බැලුවා. ඒක නම් හොඳ ගානට නිවිලා.<br>ඇය කැඳ කෝප්පය අරගෙන වාඩි වෙන්න තැනක් බැලුවා. තාත්තගේ පුටුවෙ වාඩි වුණා. ඒත් ඒක ලොකු වැඩියි. "ඒක හොඳ නෑ." එයාට හිතුණා.<br>ඊළඟ පුටුවේ වාඩි වුණා. අනේ! ඒකෙ වාඩි වුණාට එයාට ඒකත් ටිකක් හොඳ නෑ කියලා හිතුණා. ළඟින් ම තිබුණ පුංචි ම පුංචි පුටුවක් දැකලා ඇය ඒ පුටුවෙ වාඩි වුණා. ඒක ගොඩක් හොඳයි.<br>පුටුව පද්ද පද්ද කැඳ බිවුවා. පුටුව පද්දන කොට පුටුවේ කකුළක් කැඩිලා කුණ්ඩලකේෂී බිම වැටුණා. ඉක්මනට ම නැගිටලා ගෙදර උඩ තට්ටුවට නැග්ගා. කැඳ බීලා බඩ හොඳට ම පිරිලා. දැන් නිදිමතයි. එයා නිදා ගන්න ලොකු ඇඳ ළඟට ගියා. ඒකට නගින්න හදද්දී, ඇඳට එළලා තිබුණ රෙද්ද බිම වැටුණා.<br>ඊළඟට තිබුණු ඇඳට ගිහින් බලද්දි එයා දැක්කා තවත් ලස්සන සුවපහසු පුංචි ඇඳක් තියනවා. මේක හරි ම ලස්සනයි, ඉතින් ඒ ඇඳේ නිදාගන්න ඇයට හිතුණා. ඉතින් ඇය ඒ ඇඳේ නිදාගත්තා. කුණ්ඩලකේෂී නොදැනුවත්ව ම නින්ද ගියා. |

| | |
|---|---|
| | මේ අතරේ ඇවිදින්න ගිය වලස් පවුල ආපහු ගෙදරට ආවා. දොර ඇරලා තිබුණු නිසා එයාලා ටිකක් කලබල වුණා. ඉක්මනට ම ඇවිත් බලද්දී, එයාලා දැක්කා එයාලගෙ කැඳ කෝප්පය කවු ද ඉඳුල් කරලා ඇති බව.<br>"මගේ කැඳ කෝප්පය කවුරුහරි ඉඳුල් කරලා." තාත්තා කිවුවා.<br>"ඔව්, මගේ කැඳ කොප්පයත් කවුරුහරි ඉඳුල් කරලා." අම්මත් කිව්වා.<br>"අනේ! මගේ කැඳ කෝප්පේ නෑ." පුතා අඬන්න ගත්තා.<br><br>වලස් තාත්තා තවත් හොඳින් බැලුවා.<br>"මේ මගේ පුටුවේ කවුරුහරි වාඩිවෙලා." ආයෙමත් කිවුවා.<br>"ඔව්, මගේ පුටුවෙත් වාඩි වෙලා නේ." අම්මා කිවුවා.<br>වලස් පුතා දුවගෙන ආවා.<br>"අනේ! මගේ පුටුව කඩල. මගේ කැඳ කෝප්පේ බීලා." කියලා කෝප්පෙ අරන් එයා තවත් හයියෙන් ඇඬුවා.<br>"කවු ද ගෙදරට ආවේ?" තාත්තාට ප්‍රශ්නයක්. ඉක්මනට ම උඩ තට්ටුවට නැග්ගා.<br><br>තාත්තාගේ ඇඳ ළඟට ගිහින් කිවුවා,<br><br>"මෙන්න, මගේ ඇඳේ රෙද්ද ඇදලා දාලා" කියලා.<br>"අනේ! මගේ ඇඳෙත් රෙද්ද ඇදලා දාලා."<br>වටපිට බලද්දි එයාලා දැක්කා වලස් බබාගේ ඇඳේ ලස්සන ළමයෙක් නිදාගෙන ඉන්නවා.<br>ඉක්මනට වලස් පුතා එක්ක ඇවිත් පෙන්නුවා. අනේ............ පුතාට හරි ම සතුටුයි. එයා හිතුවා, එයාට ලස්සන බෝනික්කෝ දෙවියෝ ගෙනත් දීලා කියලා. වලස් පුතා සතුටින් කෑ ගැහුවා. ඒත් වලස් තාත්තයි, වලස් අම්මයි දෙතොළට ඇඟිල්ල තබා නිශ්ශබ්ද වෙන්නැයි කිවුවා.<br><br>පුතා නිහඬ වුණා. පුතාගේ හඬට කුණ්ඩලකේෂී අවදි වුණා. ඇඳ වටේට අමුතු ම සත්තු වගේ ඇඟ පුරා ම ලෝම ලොකු සත්තු........ගොඩක් බය හිතුණා. එකපාරට ම ඇඳෙන් නැගිට්ටා. විදුලියක් වගේ වේගයෙන් පඩිපෙළ බැහැලා, මිදුලට ඇවිත්, පාර දිගේ දුවන්න පටන් ගත්තා. වලස් බබාට දුක හිතුණා. එයත් කුණ්ඩලකේෂීගේ පස්සේන් අඬමින් දුවන්න පටන් ගත්තා.<br>"අනේ! ඔයා යන්න එපා....... මම තනියෙන් ඉන්නේ ඔයා අපිත් එක්ක ඉන්නකෝ......." එයා කෑ ගහලා කිවුවා. කුණ්ඩලකේෂී හොඳට ම බය වෙලා පස්ස නොබලා ම දිවුවා.<br><br>"පුතේ, මිනිස්සු අපිත් එක්ක කවදාවත් ඉන්න කැමති නැහැ. එයාලා කැමති එයලගේ අයත් එක්ක ඉන්න. කැලේ ඉන්න එයාලට බෑ." වලස් තාත්තා වලස් පුතාගේ හිස අතගාලා කිවුවා. වලස් බබා දිග සුසුමක් හෙළලා අම්මාත් තාත්තත් එක්ක එකතු වුණා. |
| තක්සේරුව | සිසු අත්පොතේ සෑම ළමයෙකුටම ඇඳුම බැගින් යා කිරීමට යොමු කරන්න. |
| <br>තිවසේ දී | කොස් කොළ, දෙල් කොළ, බුළත්කොළ සපයා ගෙන ඒවායේ විශාලත්වය අනුව ගොඩවල් 3කට වෙන් කරන්න. වෙන් කරන ලද ගොඩවල් චිත්‍රයට නගන්න. |


| ක්‍රියාකාරකම අංක - 05 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | ද්‍රව්‍ය භාවිතයෙන් අවිචලතාව හඳුනාගනියි. |
| 03. ඉගෙනුම් පල | භාජනයේ හැඩය වෙනස් වුව ද, ද්‍රව පරිමාව වෙනස් නොවන බව හඳුනා ගනියි. |
| 04. ඉගෙනුම් සම්පත් | විවිධ හැඩයෙන් යුතු විනිවිද පෙනෙන බෝතල් පහක්, ජෑම් බෝතල, කාලේ බොතල්, ලීටර එකේ බෝතලය, ජල බේසම්, පුනීල. |
| 05 ක්‍රියාවලිය<br>පියවර 01 | තාත්තා ඊයේ ගෙනාව බීම බෝතලය අද උදේ දරුවෝ දෙනාට ම සහ අම්මටත් තාත්තටත් බෙදුවා. මල්ලි පාසල් යන්න ලෑස්ති වෙලා තුන්දෙනාගේ බෝතල් තුන පිළිවෙළකට පේළියට තියලා බැලුවා. ඊට පස්සේ එයාට බීම අඩුයි කියලා අඬන්න පටන් ගත්තා. අම්මා<br>"මොක ද පුතේ හඬන්නේ?" කියලා ඇහුවා.<br>"මට බීම ටිකයි දාලා තියෙන්නේ" එයා නොනවත්වා ම ඇඬුවා. අම්මා කතා නොකර ම බීම ඔක්කො ම එක ලොකු බෝතලයකට දැම්මා. ළමයින්ට දුක හිතුණා. මල්ලිට දොස් කිවුවා. අම්මා නැවතත් එක සමාන වීදුරු තුනක් අරගෙන නැවත බීම වීදුරු පුරවා පෙන්නුවා. ඒවා ළමයින්ගේ බෝතල්වලට දැම්මා. ළමයි නිහඬ වුණා.<br>"ළමයි නිහඬ වුණේ ඇයි?" සාකච්ඡා කරන්න.<br><br>• බෝතල් හැඩය සහ ප්‍රමාණය අනුව වෙනස් වන බවත් තහවුරු කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කරන්න.<br>• විවිධ ප්‍රමාණයෙන් හා හැඩයෙන් යුතු බෝතල් තුනක් සහ වීදුරුවක් ගන්න. සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.<br>• වර්ණ කළ දියර වීදුරුව බැගින් පුනීලය භාවිතා කරමින් භාජන තුනට දැමීමට යොමු කරන්න. ඒ ඇසුරින් කරුණු තහවුරු කරන්න.<br>• ක්‍රියාකාරකම සඳහා භාවිතා කළ බෝතල් තුන ප්‍රදර්ශනය කර සාකච්ඡා කරන්න.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස දෙන්න.<br>• ජයග්‍රහණය අගයන්න. |
| තක්සේරුව | • බෝතල් වල ඇති දියර ප්‍රමාණය පාට කරන්න. |
| <br>නිවසේ දී | නිවසේ ඇති විවිධ හැඩයේ විනිවිද පෙනෙන භාජන තුනක් ගන්න.භාජන වළට පීරිසි කෝප්පයකින් වර්ණකල දියර එක බැගින් දමන්න.දියර ප්‍රමාණය නිරීක්ෂණය කරන්න. |

| ක්‍රියාකාරකම අංක - 06 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | දිග මැනීම ආශ්‍රිත ගැටලු විසඳයි. |
| 03. ඉගෙනුම් පල | වස්තු දෙකක හෝ පුද්ගලයන් දෙදෙනෙකුගේ උස සසඳයි.<br>වස්තුවල උස වැඩි, උස අඩු හා උස සමාන ලෙස වස්තුවල උස සන්සන්දනය කරයි. |
| 04. ඉගෙනු මිසම්පත් | ලී කුට්ටි/ බිල්ඩින් බ්ලොක්ස් |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකාරකම 01 | • සිසුන් එළිමහනට කැඳවාගෙන යන්න.<br>• සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.<br>• ලී කුට්ටි බිල්ඩින් බ්ලොක්ස් සියල්ල එක ගොඩකට එක ස්ථානයක තබන්න.<br>• ලී කුට්ටි බිල්ඩින් බ්ලොක්ස් වරකට එක බැගින් තම කණ්ඩායමට රැගෙන යන්න.<br>• සපයා ගත් ලී කුට්ටිවලින් තම කණ්ඩායමට කැමති උසකින් නිර්මාණයක් ගොඩනැගීමට උපදෙස් දෙන්න.<br>• අනෙක් කණ්ඩායමේ ගොඩනැගූ උස ගොඩනැගීම් නිරීක්ෂණයට අවස්ථාව දී සිසු අදහස් විමසන්න.<br>• මෙසේ උස ම ගොඩ නැගීම හා මිටි ම ගොඩනැගීම පිළිබඳව සාකච්ඡා කරන්න.<br>• මේ ආකාරයට සියලු ම කණ්ඩායම්වල ගොඩනැගීම්වල උස ම මිටි ම සන්සන්දනය කර උස ම මිටි ම ගොඩනැගීම හඳුනා ගැනීමට අවස්ථාව දෙන්න.<br>• සෑම දරුවෙකුට ම මෙය තහවුරු වන ආකාරයට කිහිප වතාවක් සසඳා බැලීමට අවස්ථාව දෙන්න.<br>• උදවු අවශ්‍ය වන අවස්ථාවේ ගුරු සහාය ලබා දෙන්න. |
| තක්සේරුව | උස, මිටි හා උස ම රූප නිවැරදි ව හඳුනා ගන්නේ නම් ගුරු නිරීක්ෂණය මගින් තක්සේරු කරන්න. |
| <br>නිවසේ දී | නිවසේ ඇති උස හා මිටි භාජන දෙකක් සපයා ගෙන, උස හා මිටි භාජන හඳුනා ගන්න. චිත්‍රයට නගා උස ම එක පාට කරන්න. මිටි භාජනය වටා රවුමක් අඳින්න. |

| ක්‍රියාකාරකම අංක - 07 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | දිග මැනීම ආශ්‍රිත ගැටලු විසඳයි.<br>වස්තු දෙකක දිග සසඳයි. |
| 03. ඉගෙනුම් පල | වස්තු 2ක් එක ළඟ තබා දිග සසඳ යි.<br>අභිමත මිනුමක් භාවිත කර දිග සසඳයි.<br>වස්තුවල දිග සැසඳීමේ දී දිග හා කොට යන වචන භාවිත කරයි. |
| 04. ඉගෙනු ම්සම්පත් | පාට කඩදාසිවලින් කපා ගත් රතු සහ කහ මල්, බීම බට, බීම බට කැබලි, ටුවයින් නූල්, පැන්සලක්, ලී කුට්ටි, සොපින් බෑග් එක් අයෙකුට එක බෑගින් |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකාරකම 01 | • සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.<br>• කණ්ඩායම් දෙකකට බීම බට හා මල් බෙදා දෙන්න.<br>• අඟලක පමණ දිග බීම බට කැබැල්ල ලබා දෙන්න.<br>• තමාට ලැබී ඇති නූලට මලක් හා බීම බට කෑල්ලක් බැගින් මාරුවෙන් මාරුවට අමුණන්න ඉඩ දෙන්න. (මිනිත්තු 10 ක කාලයක්)<br>• කණ්ඩායමේ අමුණන ලද මල් වැල් දෙක එකින් එකට දිග සසඳන්න.<br>• දිග මල් වැල හා කොට මල් වැල කුමක්දැයි දරුවන්ගෙන් විමසන්න.<br>• අභිමතය ඒකකයකින් මල් වැල් දෙක ම මනින්න.<br>• මල් වැල් දෙකෙහි වෙනස ගැන කතා කරන්න.<br>• නැවත මල්වැල් 2 පැන්සලකින් මනින්න.<br>• දිග සසඳමින් සාකච්ඡා කරන්න.<br>• අවසානයේ සියලු ම කණ්ඩායම්වල දිග ම මල් වැල් හා කොට ම මල් වැල සෙවීමට යෝජනා කරන්න.<br>• ප්‍රමාණවත් තරම් ලී කුට්ටි හෝ කෝටු කැබලි කණ්ඩායම් දෙකට ලබා දෙන්න. |
| ක්‍රියාකාරකම 02 | • තම කණ්ඩායමට ලැබුණු ලී කුට්ටි හෝ ලී කැබලි එක ළඟ එක පේළියට තැබීමට උපදෙස් දෙන්න.<br>• කණ්ඩායම් දෙක සෑදූ නිර්මාණ ගැන සාකච්ඡා කරන්න.<br>• එම පේළි අභිමත ඒකකයකින් මනින්න.<br>• එහි දිග ලී කුටි හෝ ලී කැබලි පේළිය ගැන හා කොට ලී කුට්ටි හෝ ලී කැබලි ගැන සාකච්ඡා කරන්න.<br>• සාදන ලද ලී කුට්ටිවල දිගට සමාන කෝටුවක් හෝ ලණු කෑල්ල සපයා ගන්න.<br>• එම ලණු හෝ කෝටු කැබලි 2 ළඟ තබා සැසඳීමටත් අභිමත ඒකකවලින් මැනීමටත් යොමු කරන්න. |
| තක්සේරුව | සිසු අත්පොතේ<br>• දිග රූපය පාට කරන්න.<br>• කොට රූපය පාට කරන්න. |


| ක්‍රියාකාරකම අංක - 08 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | විවිධ ඝන වස්තුවල ලක්ෂණ හා ස්වභාවය අනුව ආකෘති ගොඩනගයි. |
| 03. ඉගෙනුම් පල | විවිධ ඝන වස්තුවල ස්වභාවය හා ලක්ෂණ විස්තර කරයි.<br>හැඩයෙන් සමාන ඝන වස්තු හඳුනාගෙන වෙන් කරයි.<br>පරිසරයේ ඇති හැඩ හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>විවිධ ඝනවස්තුවල ස්වභාවය අනුව ආකෘති ගොඩනැගීම සඳහා යොදා ගනියි. |
| 04. ඉගෙනුම් සම්පත් | ඝනකය/සිලින්ඩරය, ගෝලය, අර්ධ ගෝලය, ආදී ප්ලාස්ටික් හෝ කඩදාසිවලින් සකසන ලද ඝන වස්තු කීපයක්.<br>කුඩා ඇසුරුම් පෙට්ටි, ගිනිපෙට්ටිය, සබන් පෙට්ටි, ප්ලාස්ටික් කැට සැමන් ටින්, බෝල |
| 05. ක්‍රියාවලිය<br>පියවර 01 | • සපයා ගත් ඝන වස්තු පන්තියේ ඉදිරියේ තබන්න.<br>• එක් එක් ඝනවස්තුව ගැන දරුවන් සමග සාකච්ඡා කරන්න.<br>• සාකච්ඡා කරන ඝන වස්තුව දරුවාට ලබා දී ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න. ගුරුවරයා සාකච්ඡා කිරීමට අතට ගන්නා වස්තුව සිසුන්ට ද ගොස් එම වස්තුවම අතට ගැනීමට අවස්ථාව ලබා දෙන්න.<br>• ඒ ආකාරයට ම සෑම ඝන වස්තුවක් ගැන ම සාකච්ඡා කරන්න.<br>• ඝන වස්තුවල ලක්ෂණ පිළිබඳව දරුවන්ගෙන් විමසන්න.<br>• සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.<br>• තමන් කැමති නිර්මාණයට කිරීමට සුදුසු ඝනවස්තු තෝරා ගෙනැවිත් එය ගොඩනැගීමට අවස්ථාව දෙන්න.<br>• සැකසූ නිර්මාණ ඇගයීමට ලක් කර සාකච්ඡා කරන්න.<br>• භාවිතා කළ ඝන වස්තු තිබූ ස්ථානයේ ම තබා නැවත තමන් කැමති නිර්මාණයක් ගොඩ නැගීමට වේලාව ලබා දෙන්න. |
| තක්සේරුව | දී ඇති රූපය පාට කරන්න.<br>තමා ගොඩනගන ලද නිර්මාණයට නමක් ලබා දෙන්න. |
| <br>නිවසේ දී | නිවසේ දක්නට ලැබෙන ඝන වස්තු ආකෘති නිරීක්ෂණය කර රූප අඳින්න, පාට කරන්න.<br>• ගිනිපෙට්ටිය<br>• ගඩොල් කැටය<br>• සබන් පෙට්ටිය |

| ක්‍රියාකාරකම අංක 09 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | අසමාන බර සහිත වස්තු දෙකක බර සසඳ යි. |
| 03. ඉගෙනුම් පල | වස්තු දෙකක බර අඩු හා බර වැඩි වශයෙන් සසඳ යි.<br>අසමාන බර සහිත වස්තු 2 බර සසඳා බර අඩු හෝ බර වැඩි වශයෙන් හඳුනාගෙන ප්‍රකාශ කරයි. |
| 04. ඉගෙනුම් සම්පත් | සෙල්ලම් තරාදි, අල ගෙඩි කිහිපයක්, ගල් කීපයක්, විවිධ ප්‍රමාණයේ ලී කුට්ටි කිහිපයක්, ඇට මලු, වැලි මලු, කිලෝ එකක් වන වැලි හෝ පස් මල්ලක්, |
| 05. ක්‍රියාවලිය<br>පියවර 01 | • සිසුන් එළිමහන ස්ථානයට රැගෙන යන්න.<br>• හැම දරුවෙකුට ම එක ප්‍රමාණයේ වැලි මල්ලක් ලබා දී, එය හිස මත තබාගෙන නිදහසේ ඇවිදීමට යොමු කරන්න.<br>• ඊළඟ අවස්ථාවේ නැවත වැලි මල්ල අතට ගෙන නිදහසේ ඇවිදින්නට සලස්වන්න.<br>• සිසුන් යුගල කරමින් වැලි මලු දෙකක් එක බෑගයකට දමා ඔසවා බැලීමට සලස්වන්න.<br>• සියලුම දෙනාට ඔසවා බැලීමට අවස්ථාව දෙන්න.<br>• මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න.<br>• ඇති වූ වෙනස සාකච්ඡා කරන්න.<br>• නැවත වැලි මලු තුන එකට දමා ඔසවාගෙන යාමට හැකි දැයි බැලීමට යෝජනා කරන්න.<br>• වැලි මලු තුන එසවීමේ දී තම අතට සිදුවන දේ විමසන්න.<br>• එය පොළොව දෙසට ඇදී යන අයුරු සාකච්ඡා කරන්න.<br>• ඇතිවන අපහසුතාවය පිළිබඳව සාකච්ඡා කරන්න.<br>• *(අපහසුතාවය ක්‍රමයෙන් ඇතිවන තුරු ප්‍රමාණය වැඩි කරන්න.)*<br>• අපි තරදියෙන් බර කිරමු ක්‍රියාකාරකමෙහි යොදවන්න. |
| ක්‍රියාකරකම 2 | • සපයා ගත් ඇට මලු 2 දරුවාගේ දෙඅත්වලට ලබා දී, එම බර දෙක සැසඳීමට යොමු කරන්න.<br>• නැවත එම ඇට මලු දෙක තරාදියට දමා බර අඩු බර වැඩි බව හඳුනා ගැනීමට උපදෙස් දෙන්න.<br>• බර වැඩි මල්ලේ ස්ටිකරයක් (*) සලකුණ යොදන්න. |
| ක්‍රියාකරකම 3 | • විවිධ ප්‍රමාණයේ ලී කුට්ටි දෙක බැගින් සිසුන්ට ලබා දෙන්න.<br>• ලී කුට්ටි දෙක අත් දෙකට ගෙන බර සසඳන්න.<br>• ලී කුට්ටි 2 තරාදියක දමා බර කිරා බර අඩු වැඩි බව හඳුනා ගැනීමට අවස්ථාව දෙන්න.<br>• බර වැඩි කුට්ටියට ද සලකුණක් (*) යොදන්න.<br>• කණ්ඩායම් හතරකට සිසුන් වෙන් කරන්න.<br>• බර වැඩි ලෙසින් ලකුණු කළ ඇට මලු දෙක හා ලී කුට්ටි වර්ග දෙකක් කණ්ඩායමේ නායකයාට ලබා ගැනීමට උපදෙස් දෙන්න. නැවත ලබාගත් ද්‍රව්‍ය 2 අතට ගෙන සසඳා බලා බර වැඩි ද්‍රව්‍ය සොයා බැලීමට සඳහා තරාදියට දමා කිරා බැලීමට යොමු කන්න.<br>• මේ සඳහා කණ්ඩායම් හතරට අවස්ථා ලබා දෙන්න. |


| | |
|---|---|
| | • කණ්ඩායම් හතරේ ම බර වැඩි වූ ද්‍රව්‍ය හතර ගෙන නැවත කිරා බැලීමට දෙන්න. |
| තක්සේරුව | දී ඇති රූපය පාට කරන්න.<br>තමා ගොඩනඟන ලද නිර්මාණයට නමක් ලබා දෙන්න. |
| <br>නිවසේ දී | සකස් කර ගත් තරාදියකින් තම නිවසේ එළවළු වර්ග, අල වර්ග, ගෙඩි වර්ග, ඇට වර්ගවල බර මනින්න. එහි බර අඩු වැඩි බව ප්‍රකාශ කරන්න. එහි රූප දෙක අඳින්න. |


| ක්‍රියාකාරකම අංක - 10 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | එකම වර්ගයේ ද්‍රව්‍ය/ රූප 10 නිවැරදි ව ගණන් කරයි. |
| 03. ඉගෙනුම් පල | 1 - 10 තෙක් නිවැරදි ව අනුපිළිවෙළින් කියයි.<br>එකම වර්ගයේ ද්‍රව්‍ය දහයක් ගණන් කරයි.<br>එකම වර්ගයේ රටාවකට පිහිටි රූප දහයක් ගණන් කරයි. |
| 04. ඉගෙනුම් සම්පත් | මල් කොඩි, බෝතල් මූඩි, ඇට වර්ග, කොඩි, සනක, ගල්කැට ආදි ගණන් කිරීමට සුදුසු ද්‍රව්‍ය, රටාවක ට රූප අලවන ලද පත්‍රිකා අවශ්‍ය ප්‍රමාණයට සපයා ගන්න. |
| 05. ක්‍රියාවලිය<br>පියවර 01 | ● සෑම ළමයෙකුට ම ගණන් කිරීමට සුදුසු ද්‍රව්‍ය කට්ටලයක් ලබා දෙන්න.<br>● පෙර දැනුම මැනීමට 1 - 6 තෙක් ද්‍රව්‍ය ගණන් කරන්න.<br>● 1 - 6 තෙක් ද්‍රව්‍ය ගණන් කිරීමට යොමු කරන්න.<br>● සිසුන් කණ්ඩායම් කරන්න.<br>● ගණන් කිරීමට සුදුසු ද්‍රව්‍ය සෑහෙන ප්‍රමාණයක් භාජනයකට දමා කණ්ඩායමට ලබා දෙන්න.<br>● එම භාජනේ සෑම ළමයෙකුට ද්‍රව්‍ය තෝරා ඉන් දහයක් ගැනීමට උපදෙස් දෙන්න.<br>● බිම අඳින ලද කොටු දහයක පේළියක් සකසා ගන්න.<br>● සිසුන් ඒ ඉදිරියට කැඳවන්න.<br>● ඒ අතර එක් සිසුවෙක් නම් කරන්න.<br>● ඒ සිසුවාට 10 ට අඩු සංඛ්‍යාවක් කීමට පවසන්න.<br>● එම සංඛ්‍යාවට අදාළ ද්‍රව්‍ය රැගෙන ගොස් කොටු තීරුවේ එකේ සිට ගණන් කිරීමට උපදෙස් දෙන්න.<br>● මේ ආකරයට සියලු දෙනාම ක්‍රියාකාරකමේ යොදවන්න.<br>● සිසුන් සියලු දෙනා ම අගය කරන්න.<br>● අවශ්‍ය අයට සහාය ලබා දෙන්න. |
| ක්‍රියාකරකම 2 | සපයා ඇති ශාක පත්‍ර 10 ගණන් කරමින් සුදුසු පරිදි පේළියට තබා ගණන් කිරීමට සලසන්න.<br>නිරීක්ෂණය කරමින් අගය කරන්න. |
| තක්සේරුව | ඉහත ක්‍රියාකාරකම් නිවැරදි ව 1 - 10 තෙක් ද්‍රව්‍ය කරන්නේ නම් ප්‍රවීණතාවයට පත් ව ඇති බව සලකන්න. |
| <br>නිවසේ දී | එක පෙළට කෝම්පිට්ටු දහයක් සකස් කරන්න.<br>ඒවා පිළිවෙළට 1- 10 තෙක් ගණන් කරන්න.<br>ඒවා ඇඳ පාට කරන්න. |


| ක්‍රියාකාරකම අංක - 11 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | රටාවකට පිහිටි ද්‍රව්‍ය/රූපවල රටාව හඳුනාගෙන තවදුරටත් රටාව ගොඩ නඟයි. |
| 03. ඉගෙනුම් පල | ද්‍රව්‍ය රූප වර්ග දෙකක් හෝ තුනක් මගින් සරල රටාවක් ගොඩ නගයි. |
| 04. ඉගෙනුම් සම්පත් | බෝතල් දෙකක්, බෝතල් මුඩි වර්ග දෙකක්, ගම්, ළමුන් සංඛ්‍යාවට ගැළපෙන සේ කොටු අටක් සහිත කඩදාසි තීරු, කොඩි සෑදීමට පාට කීපයකින් කඩදාසි, ඇට වර්ග දෙකක්, ටුවයින් නූල්, හිදැස්පත්, පාට පැන්සල්, |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකාරකම 01 | • ඇට වර්ග දෙකක් ළමුන් ලවා සපයාගන්න.<br>• සෑම සිසුවෙකුටම කඩදාසි තීරුව බැගින් සපයා දෙන්න.<br>• සිසුන් එළිමහනට කැඳවාගෙන ගොස් එක් එක් සිසුවාට කඩදාසි තීරුව බැගින් දෙන්න<br>• කොටුවක් හැර කොටුවක් ඇට වර්ග හෝ සුදුසු ද්‍රව්‍ය මාරුවෙන් මාරුවට තබමින්, රටාව ආදර්ශනය කරන්න.<br>• සිසුන් ලවා ක්‍රියාත්මක කරවන්න, නිරීක්ෂණය කරන්න, අවශ්‍ය උපදෙස් ලබා දෙන්න. |
| ක්‍රියාකරකම 2 | • සෑම දරුවෙකුටම A4 කොළ බැගින් හා හිඩැස් පත බැගින් ලබා දෙන්න. පන්තියේ සිසුන්ගෙන් අඩකට වෘත්තය සහිත හිඩැස් පතත්, ඉතිරි සිසුන්ට ත්‍රිකෝණ සහිත හිඩැස්පතක් ලබා දෙන්න.<br>• A4 කොළය දෙකට නවා එක් භාගයක හිඩැස් පත තබා නිල් පාටින් පාට කරවන්න.<br>• ත්‍රිකෝණය නිල් පාදුන් ද වෘත්තය රතු පාටින් ද පාට කරවන්න.<br>• සියළුම සිසුන් පාට කළ පසුව, අඳින ලද රූපය පිළිබඳව සාකච්ඡා කරන්න.<br>• එම රූපය ප්‍රදර්ශනය කිරීමට සුදුසු වන සේ අවශ්‍ය තරම් දිගට නූලක් ළමයාගේ උසට රැඳවුම් දෙක රඳවන්න.<br><br>• එම නූලෙහි මාරුවෙන් මාරුවට තම අත ඇති රූපය රැඳවීමට උපදෙස් දෙන්න.<br><br>• නැවතත් එම රූපවලින් ම රටාව ගොඩ නගන්න. |

| | |
|---|---|
| | • අවස්ථා කිහිපයක් එම රූප මාරු කරමින් රටාව ගොඩ නැගීමට අවස්ථා ලබා දෙන්න.<br>• ගුරුතුමිය විසින් සපයන ලද වෙනත් රූපය ඉහත අයුරින් රටාව වෙනස් කරමින් ගොඩනගන්න. |
| තක්සේරුව | දී ඇති රටාව සම්පූර්ණ කරන්න. |
| <br>නිවසේ දී | • විවිධ වර්ගයේ ශාක පත්‍ර අහුලා ගන්න.<br>• ඒවා රටාවට තබන්න. මේ ආකාරයට තමා කැමති ද්‍රව්‍ය වර්ග දෙකක් ගෙන රටාව සකසා එය චිත්‍රයට නගන්න. |

| ක්‍රියාකාරකම අංක - 12 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | එකිනෙකට වෙනස් භාජන 2 ක ධාරිතාව අල්ලන ද්‍රව ප්‍රමාණය ඇසුරින් සසඳයි. |
| 03. ඉගෙනුම් පල | තරමක් වෙනස් භාජන 2ක ධරිතාව ජලය අඩුවෙන් අල්ලන සහ ජලය වැඩියෙන් අල්ලන භාජනය ලෙස සසඳයි.<br>කුඩා භාජනයක් ආධාරයෙන් භාජන දෙකක ධාරිතාව සසඳයි.<br>අල්ලන ප්‍රමාණ කුඩා භාජනයකින් මැන භාජන 2 ක ධාරිතාව සසඳයි.<br>විවිධ ක්‍රම භාවිතයෙන් භාජන දෙකක ධාරිතාව සසඳයි. |
| 04. ඉගෙනුම් සම්පත් | විවිධ වර්ගයේ හැඩයෙන් හා තරමින් යුත් බෝතල් හා භාජන, බෙසම් පාට කළ ජලය, යෝගට් කෝප්ප හෝ කුඩා භාජන, පුනීල. |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකරකම 1 | දරුවන් එළිමහනට කැඳවා ගෙන යන්න.<br>• විවිධ හැඩයේ හා තරමේ භාජන/බෝතල් දෙකක් මේසය මත තබා ඒවායේ ප්‍රමාණය අල්ලන ජල ප්‍රමාණය පිළිබඳ කතාබහ කරන්න.<br>• එකම වර්ගයේ වුව ද වෙනස් තරමේ භාජන බෝතල් දෙකක් පෙන්වා දෙකෙහි ම තරම හා අල්ලන ජල ප්‍රමාණය පිළිබඳව විමසන්න.<br>• කුඩා ජල භාජන කුමක් ද?<br>• විශාල ජල භාජන කුමක් ද?<br>• අල්ලන ජල ප්‍රමාණය සමාන ද? |
| ක්‍රියාකරකම 2 | • සමාන භාජන දෙකක් ගුරුතුමියගේ අතට ගෙන භාජනවලට ජලය දමා ඒවාට අල්ලන ජල ප්‍රමාණය පිළිබඳව සාකච්ඡා කරන්න.<br>• එවැනි සමාන වීදුරු දෙකක් දරුවන්ට ලබා දී යෝගට් කෝප්පවලින් වීදුරුවලට ජලය පිරවීම යොමු කරන්න.<br>• මෙහි වීදුරු දෙකට අල්ලන ජල ප්‍රමාණය පිළිබඳව සිසු අදහස් විමසන්න. |
| ක්‍රියාකරකම 3 | • හැඩය හා තරම වෙනස් භාජන දෙකක් සෑම දරුවකුට ම සපයා දෙන්න.<br>• භාජනවලට අල්ලන ජල ප්‍රමාණය පිළිබඳව අත්හදා බැලීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.<br>• ඔවුන් කරන දේ පිළිබඳව විමසිලිමත් වන්න, එක් එක් සිසුවා සොයාගත් දේ විස්තර කිරීමට අවස්ථාව ලබා දෙන්න.<br>• එක් භාජනයක ජලය වැඩියෙන් අල්ලන බවත් අනෙක් භාජනය ජලය අඩුවෙන් අල්ලන බවත් ගුරුවරයා දරුවන්ට තහවුරු කරවන්න.<br>• අවස්ථා කිහිපයක් එම රූප මාරු කරමින් රටාව ගොඩ නැගීමට අවස්ථා ලබා දෙන්න. |
| ක්‍රියාකරකම 04 | • විනිවිද පෙනෙන තරමක් ලොකු බෝතලයක් සහ එයට තරමක් කුඩා ප්‍රමාණ දෙකකින් යුත් භාජන හෝ බෝතල් දෙකක් තෝරා ගන්න.<br>• කුඩා භාජන දෙකට ජලය පුරවන්න.<br>• පළමුව එක් භාජනයක ජලය විනිවිද පෙනෙන බෝතලයකට දමන්න.<br>• එහි ජල මට්ටම කඩදාසි තීරුවකින් ලකුණු කරන්න. |


| | |
|---|---|
| | • එම ජලය ඉවත් කර අනෙක් කුඩා භාජනයේ ජලය ලොකු භාජනයට දමන්න. දැන් එහි ඇති ජල මට්ටම ද සලකුණු කර ජල මට්ටම් දෙක අනුව වැඩියෙන් හා අඩුවෙන් ජලය ඇල්ලූ භාජන පිළිබඳ සාකච්ඡා කරන්න.<br>• සෑම ළමයෙකුට ම මෙම ක්‍රියාකාරකම් අත්දැකීම් ලැබීමට අවස්ථාව දෙන්න.<br>• එම අත්දැකීම් පිළිබඳව ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න. |
| තක්සේරුව | ජලය වැඩියෙන් අල්ලන භාජනය පාට කර තිබේ නම් ප්‍රවීණතාවයට ළඟා වී ඇති බව සටහන් කරන්න. |
| <br>නිවසේ දී | විනිවිද පෙනෙන වීදුරුවක්, ජෝගුවක්, පීරිසි කෝප්පයක්, ජෑම් බෝතලයක් සපයාගෙන යෝගට් කෝප්පය බැගින් පාටකළ ජලය එම බඳුන්වලට දමා නිරීක්ෂණය කරන්න .ඒවා ඇඳ දක්වන්න. |

| ක්‍රියාකාරකම අංක - 13 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | ජ්‍යාමිතික හැඩතල භාවිතයෙන් නිර්මාණ කරයි. සරල රටාවක් ගොඩ නගයි. |
| 03. ඉගෙනුම් පල | වෘත්තය, ත්‍රිකෝණය, සෘජුකෝණාස්‍රය, සහ සමචතුරස්‍රය යන ජාමිතික හැඩතල හඳුනාගෙන නම් කරයි. ජාමිතික හැඩතල භාවිතයෙන් නිර්මාණ ගොඩනගයි. ජ්‍යාමිතික හැඩතල අඳියි.<br>හැඩතල ඇසුරෙන් රටාවක් ගොඩ නගයි. |
| 04. ඉගෙනුම් සම්පත් | පාට හතරකින් වර්ණ කඩදාසි, කතුරු, කපාගත් හැඩතල 4 බැගින් සෑම ළමයෙකුට ම එක් කට්ටලය බැගින්, ජ්‍යාමිතික හැඩතල සහිත හිඩැස්පත්, ඩිමයි කොළ, ගම්. |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකරකම 1 | • පන්ති කාමරය තුළ දී හැඩතල එකක් සෑම දරුවෙකුට ම ලබා දෙන්න.<br>• පහසු හා හොඳින් පෙනෙන ස්ථානයක ඩිමයි කොළ හතර අලවන්න.<br>• ආදර්ශනය කරන කොළවල අදාළ හැඩතල එක බැගින් එක් පසෙක අලවා තබන්න.<br><br>• පළමු ව සිසුන් අත ඇති හැඩතලවලින් එක් හැඩයක් තෝරා (වෘත්තය) ප්‍රදර්ශනය කරන ලද කොළයේ ළමුන් ලවා අලවන්න.<br>• සියලු ම වෘත්ත ඇලවූ පසු දෙවන හැඩතලය ලෙස ත්‍රිකෝණය තෝරා ඇළවීමට උපදෙස් දෙන්න.<br>• දෙවන හැඩතලයන් ලෙස තෝරාගත් ත්‍රිකෝණය විවිධ පැතිවලට හරවා නිදහසේ ඒ ඇලවීමට යොමු කරන්න.<br>• සමචතුරස්‍රය හා සෘජුකෝණාස්‍රය ද එලෙසින් ම විවිධ දිශාවන්ට හරවා ඇලවීමට විශේෂ අවධානය යොමු කරන්න.<br>• මෙම සිසුන් විසින් ඇලවූ හැඩතල පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.<br>• විවිධත්වය පිළිබඳව අවධානය යොමු කරන්න. (ලොකු, කුඩා,) |
| ක්‍රියාකරකම 2 | • සෑම දරුවකුට ම හිඩැස් පතක් ලබා දෙන්න.<br>• පාට කඩදාසි ලබා දෙන්න.<br>• හිඩැස් පත පාට කඩදාසියේ තබා ඇඳ කපා ගැනීමට උපදෙස් දෙන්න.<br>• කැපූ හැඩතල ඉදිරියේ තැබූ භාජනයට තබන්න. ඒවා මිශ්‍ර කර ගන්න.<br>• ගුරුවරයා දෙන සංඥාවට අනුව තමා කැමති හැඩතලය ගෙන කණ්ඩායමට යාමට උපදෙස් දෙන්න.<br>• කණ්ඩායමේ සිටින සිසුන් ගෙන ආ හැඩතල යොදා ගෙන නිර්මාණයක් කිරීමට උපදෙස් දෙන්න.<br>• ළමුන් කළ නිර්මාණය අගයන්න. |

| | |
|---|---|
| | • නිර්මාණයට නමක් යෝජනා කරන්න.<br>• නිර්මාණය පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න. යොදාගත් හැඩතල පිළිබඳ කතා කරමින් අගයන්න. |
| තක්සේරුව | • අදාළ ක්‍රියාකාරකමේ දරුවන් නිරත වන ආකාරය නිරීක්ෂණය කර අවශ්‍ය නිපුණතාවයට පැමිණ ඇත්දැයි සටහන් කරන්න.<br>• හැඩතල කිහිපයක් යොදාගෙන නිර්මාණයක් කර ක්‍රියාකාරකම් පොතේ අලවන්න. |
|  නිවසේ දී | කැමති හැඩතල කිහිපයක් බැගින් කපා ගන්න. කැමති නිර්මාණයක් කරන්න. එය පොතේ අලවන්න. |


<table>
<tr><th colspan="2">ක්‍රියාකාරකම අංක - 14</th></tr>
<tr><td>01. කාලය</td><td>පැය 2යි.</td></tr>
<tr><td>02. නිපුණතාව</td><td>1 - 9 තෙක් ක්‍රම සූචක සංඛ්‍යා හඳුනාගෙන භාවිත කරයි.</td></tr>
<tr><td>03. ඉගෙනුම් පල</td><td>1 -9 තෙක් වූ ක්‍රම සූචක සංඛ්‍යා නිවැරදි ව භාවිත කරයි.</td></tr>
<tr><td>04.ඉගෙනුම් සම්පත්</td><td>සත්ව රූප ගෙම්බා, ඉබ්බා, හාවා, කුකුළා, පළගැටියා, වඳුරා, වළහා, සහ අලියා, සත්ව රූප ළමයකුගේ රූපයක් සකසා ගත් ඔටුන්නක්, මාළිගාවක රූපයක්</td></tr>
<tr><td>05. ක්‍රියාවලිය<br>ක්‍රියාකාරකම 01</td><td>

- එළිමහනේ හෝ නිදහස් ස්ථානයක බිම රූප සටහනේ පෙනෙන පරිදි සැලැස්මක් සකස් කරන්න.
- සත්ව රූප පොළොවේ සිට විය හැකි ආකාරයට කොටුවක රඳවා ගන්න.






- අංක 1න් පටන් ගෙන ළමයා එක, දෙක, තුන කොටුවලින් පනින්න.
- අත් දෙක බිම තබන්න.
- පසෙකින් ඇති රූපයේ සිටින ගෙම්බා අනුකරණය කරමින් 4, 5, 6 පනින්න.
- රවුම තුළ අත තබා RESET කරන්න.
- කොඩියේ ඇති කුකුළා අනුකරණය කරමින් 7, 8, 9 පනින්න.
- රවුම තුළ අත් දෙක තබා කරන්න. හාවා අනුකරණය කරමින් එක, දෙක, තුන පනින්න.
- රවුම තුළ අත තබා RESET කරන්න.
- පළගැටියා අනුකරණය කරමින් 4, 5, 6 පනින්න.
- රවුම තුළ අත් දෙක තබා RESET කරන්න.
- වළහා අනුකරණය කරමින් පඩිපෙළ 7, 8, 9 යන්න.
- RESET කරන්න.
- අලියා අනුකරණය කරමින් 1, 2, 3 යන්න.

</td></tr>
</table>


| | |
|---|---|
| | • RESET කරන්න.<br>• වඳුරා අනුගමනය කරමින් පැන පැන 4, 5, 6 යන්න. RESET කරන්න.<br>• ළමයෙකු අනුකරණය කරමින් 7, 8, 9 යන පඩිපෙළින් නැග ඔටුන්න ගන්න.<br>• රජෙකු සේ මාලිගාවට යන්න.<br><br>▪ මුලින් ම ආවේ කවු ද?<br>▪ දෙවනියට ආවේ කවු ද?<br>▪ ඊළඟට ආවේ කවු ද?<br>▪ හතරවෙනියට ආවේ කවු ද?<br>▪ පස්වැනියට ආවේ කවු ද?<br>▪ 6 වෙනියට ආවේ කවු ද?<br>▪ 7 වෙනියට ආවේ කවු ද?<br>▪ 8 වැනියට ආවේ කවු ද?<br>▪ 9 වැනියට ආවේ කවු ද?<br>▪ ඇවිදගෙන ගියේ කීවෙනිය ද?<br>▪ පඩිපෙළ නැග්ගේ කීවෙනියා ද?<br>▪ 7, 8, 9 එය පඩි නැග්ගේ කීවෙනියා ද? |
| තක්සේරුව | අදාළ ක්‍රියාකාරකම් නිවරදි ව යොමුවී මාලිගාව කරා පැමිණ, ඔටුන්න ලබා ගත්තේ නම් එම දරුවා අදාළ නිපුණතාවයට පැමිණ බව නිරීක්ෂණයෙන් තහවුරු කර ගන්න. |
| <br>නිවසේ දී | සත්ව ආකෘති හෝ වාහන ආකෘති හෝ බොත්තන් යොදාගෙන එක ම දිශාවට ගමන් කරන ආකාරයට පේළියට තබා නිරීක්ෂණය කරන්න.<br><br>ප්‍රශ්න අහන්න. (දෙමව්පියන්)<br><br>මුලින් ම ඇත්තේ කුමක් ද?<br><br>අවසානයට ඇත්තේ කුමක් ද?<br><br>පස්වැනියට ඇත්තේ කුමක් ද? |

| ක්‍රියාකාරකම අංක - 15 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | වස්තු තුනක/ පුද්ගලයන් තිදෙනෙකුගේ උස/දිග සසඳයි. පටිපාටිගත කරයි. පුද්ගලයන් උස අනුව පටිපාටියට තබයි. සිටීමට සලස්වයි. |
| 03. ඉගෙනුම් පල | වස්තු තුනක/ පුද්ගලයන් තිදෙනෙකුගේ උස/දිග සසඳයි. පටිපාටිගත කරයි.<br>වස්තු තුනක දිග සසඳ යි.<br>වස්තු තුනක් දිග අනුව පටිපාටි ගත කරයි. |
| 04. ඉගෙනුම් සම්පත් | දිගින් එකිනෙකට වෙනස් තරමක් දිග කෝටු තුනක්, ඉරටු හෝ බීම බට, උසින් වෙනස් බෝතල් / පෙට්ටි, දිගින් වෙනස් කාඩ්බෝඩ් ලී කැබලි, මල් වැල් ටුවයින් නූල්, තොප්පියක්, හැඳි රූකඩ 3ක් උස ප්‍රමාණ තුනකින |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකරකම 1 | • පන්තියේ සිටින උසින් වෙනස් දරුවන් තිදෙනෙක් ඉදිරියට ගෙන්වා ගන්න.<br>• ගුරු මේසය මත තොප්පියක්, මල් මාලා, හා කොඩියක් තබන්න.<br>• පන්තියේ සිසුවෙක් කැඳවා උස ම ළමයා තෝරන්න.<br>• තවත් ළමයෙක් ගෙන්වා උස ම ළමයාට තොප්පිය දාන්න.<br>• වෙනත් දරුවකු ඉදිරියට කැඳවා උස අඩු ම ළමයා තේරීමට දෙන්න.<br>• තවත් දරුවෙකු කැඳවා උස අඩු ම ළමයාට මල් මාලය පලඳවන්න.<br>• වෙනත් දරුවෙකු කැඳවා ටිකක් උස ළමයා සොයන්නට දෙන්න.<br>• වෙනත් දරුවකු ලවා එම ළමයාට කොඩියක් ලබා දෙන්න.<br>• තවත් දරුවෙකු ගෙන්වා මෙම තුන්දෙනාගෙන් උස අඩු ළමයාගේ සිට උස වැඩි ළමයා දක්වා පටිපාටිගත කරවන්න. |
| ක්‍රියාකරකම 2 | • දරුවන් තුන්දෙනා බැගින් කණ්ඩායම් කරන්න.<br>• හැඳි 3 බැගින් සෑම කණ්ඩායමකට ලබා දෙන්න.<br>• උස වැඩි රූපයේ සිට උස අඩු රූපයය දක්වා පටිපාටි ගත කරන්න.<br>• උස අඩු ම රූපයේ සිට උස වැඩි ම රූපයය දක්වා පටිපාටි ගත කරන්න.<br>• දරුවාට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න. |
| ක්‍රියාරකම 3 | • සුදුසු තැනක පැදුරක් එලා සූදානම් කර ගන්න.<br>• ප්‍රමාණවත් තරම් රෙදි පටි ගන්න.<br>• සුදුසු පරිදි ළමයි කණ්ඩායම් තුනකට වෙන් කරන්න.<br>• කාලය මිනිත්තු 10 ලබා දෙන්න.<br>• ඒ කාලය තුළ රෙදි පටි කෑලි එකිනෙකට ගැට ගසා දිග පටියක් සකස් කරවන්න.<br>• සකසා ගත් රෙදි පටි පන්තිය ඉදිරියේ තබා සිසු අදහස් විමසන්න.<br>• එක් කණ්ඩායමේ එක් දරුවකු බැගින් දරුවන් තුන්දෙනෙකු කැඳවා දිග වැඩි එකේ සිට දිග අඩු එක දක්වා පටිපාටි ගත කරන්න.<br>• දිග අඩු එකේ සිට දිග වැඩි එකට පටිපාටිගත කරවන්න.<br>• සිසු අදහස් විමසන්න. ඒවා ඇගයීමකට ලක් කරන්න. |
| තක්සේරුව | උස ම රූපය පාට කරන්න. දිග ම රූපය පාට කරන්න. |


| | |
|---|---|
| <br>නිවසේ දී | • ගෙදර ඇති මල් පෝච්චියේ නිරීක්ෂණය කරන්න. **21**<br>• උස ම මල් පෝච්චිය තෝරන්න.<br>• මිටි ම මල් පෝච්චිය තෝරන්න.<br>• ටිකක් උස මල් පෝච්චිය තෝරන්න.<br>• උස අඩු එකේ සිට වැඩි එක දක්වා පිළිවෙළින් ඇඳ පාට කරන්න. |

| ක්‍රියාකාරකම අංක - 16 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | සංඛ්‍යා එකතු කිරීමේ ගැටලු විසඳයි.<br>එකතුව 9 වන තෙක් සංඛ්‍යා දෙකක් එකතු කර එකතුව ප්‍රකාශ කරයි. |
| 03. ඉගෙනුම් පල | එකතුව 9ට නොවැඩි වන ද්‍රව්‍ය කට්ටල දෙකක එකතුව සොයයි.<br>ද්‍රව්‍ය භාවිතයෙන් එකතුව 9ට නොවැඩි වන සංඛ්‍යා දෙකක එකතුව සොයා ප්‍රකාශ කරයි.<br>රූප භාවිතයෙන් එකතුව 9 ට නොවැඩි වන සංඛ්‍යා දෙකක එකතුව සොයයි. |
| 04. ඉගෙනුම් සම්පත් | රබර් ඇට හෝ පාට ගල් කැට, තේ ඇට, ඕනෑම ගණන් කළ හැකි ද්‍රව්‍ය දහයක්, පාට දෙකකින් සපයාගත් කඩදාසි මල් 10 බැගින්, ඩබල් ටේප්, බිසිල් බෝඩ්, නිල් හා රතු තොප්පි දෙකක්, 1 - 9 තෙක් වූ සංඛ්‍යා පත් කට්ටලය දෙකක් |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකාරකම 01 | • දරුවන් එළිමහනට කැඳවා ගෙන යන්න.<br>• එළිමහනේ සුදුසු ස්ථානයක මීටර් එකක් පමණ අරය ඇති වෘත්තයක් ඇඳගන්න.<br>• දරුවන් දෙපැත්තෙන් පෙළගස්වන්න.<br>• රවුම හරි මැදින් කෝටුවක් තබන්න.<br>• රතු තොප්පිය දැමූ ළමයා රතු මල් වට්ටියෙන් මලක් ගෙන රවුමේ එක් පැත්තකට රතු පාටින් මල් එකයි කියා රතු මලක් දැමීමට යොමු කරන්න.<br>• රතු අංක එක ඇති ළමයා එම කාඩ් පත ගෙන ඉදිරියෙන් තබයි.<br>• නිල් තොප්පිය දැමූ ළමයා ද නිල් පාට මලක් ගෙන නිල් පාටින් මල් එකයි යැයි ගයමින් නිල් මලක් අනික් අර්ධයට දමයි. ඊට අදාළ සංඛ්‍යාව ගෙනැවිත් පෙර තිබූ සංඛ්‍යාව අසලින් තබයි.<br>• ගුරුතුමිය එකතු කිරීමේ සංකේතය සංඛ්‍යාව දෙක මැදින් තබයි.<br>• මෙම ගීතය ගුරුතුමිය විසින් තාලයට ගායනා කරමින්, පිළිතුර ලබා ගැනීමට කොටුව ඉවත්කර පිළිතුර ළමුන්ගෙන් ලබා ගන්න.<br>*නිල් පාටින් මල් එකයි*<br>*රතු පාටින් මල් එකයි*<br>*එකයි එකයි එක් වුණාම රවුම ඇතුලේ*<br>*මල්* ..................................................<br>• පිළිතුර ළමුන් සම්පූර්ණ කළ පසු ගුරුතුමිය ගීතය නැවතත් ගායනා කරන්න. සංඛ්‍යා වෙනස් කරමින් ගීතයට ආදේශ කරන්න. නැවත වතාවක් තහවුරු කරන්න.<br>• නිවරදි ව උපදෙස් ලබා දෙන්න. |
| තක්සේරුව | පිළිතුර සම්පූර්ණ කිරීමට අවශ්‍ය සංඛ්‍යාව ඇඳ තිබේ නම් නිපුණතාවයට ළඟා වී ඇති බව තහවුරු කරන්න. |
| <br>නිවසේ දී | නිවසේ ඇති ප්ලාස්ටික් කෝප්ප, පිඟන් හා බෝතල් වැනි දේ සපයා ගෙන මෙම ක්‍රියාකාරකම් ලබා දෙන්න. මෙම ගැටලු විසඳන්න.<br>පිඟන් (3) + කෝප්ප (2) = ඔක්කොම (5)<br>බෝතල් (2) + හැඳි (4) = ඔක්කොම |

| ක්‍රියාකාරකම අංක - 17 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | රටාවකට පිහිටි රූප 20ක් ගණන් කරයි. |
| 03. ඉගෙනුම් පල | රටාවකට පිහිටි රූප 20 නිවැරදි ව ගණන් කරයි.<br>රටාවකට නොපිහිටි එක ම වර්ගයේ රූප 20ක් නිවැරදි ව ගණන් කරයි.<br>රටාවකට නොපිහිටි විවිධ වර්ගයේ රූප 20ක් නිවැරදි ව ගණන් කරයි. |
| 04. ඉගෙනුම් සම්පත් | A4 කඩදාසි, දියසායම්, නිල්, මුද්‍රා තැබීමට අවශ්‍ය බණ්ඩක්කා, හබරල පෙති, ඇපල් ගෙඩි 20ක රූප පත්‍රිකා, සත්ව රූප, පලතුරු, මල් සහිත පින්තූර රූප, රතු තොප්පි දෙකක්, 1 - 9 තෙක් වූ සංඛ්‍යා පත් කට්ටල දෙකක් |
| 05. ක්‍රියාවලිය<br>ක්‍රියාකාරකම 01 | • දරුවන්ගෙන් පලතුරු වත්තකට යාමට කැමති දැයි අසා, ''පලතුරුවත්තට යමු" යයි එළිමහනට රැගෙන යන්න.<br>• එළිමහනේ පලතුරු පින්තූර ඇලවූ ස්ථානයට යන්න.<br>• ඒ පිළිබඳ දරුවන් සමඟ සාකච්ඡා කරන්න.<br>• ඇපල් ගසේ තිබෙන ගෙඩි පෙන්වා එම ගෙඩි කීයක් තිබේ ද? "අපි ගණන් කරමු." යැයි පවසා එහි රඳවා ඇති පින්තූර ඇපල් ගණන් කරන්න.<br>• කිහිප වතාවක් ශබ්ද නගා ඇපල් ගෙඩි 20 ගණන් කරන්න.<br>• සිසුන් තනි තනි ව ගණන් කිරීමට අවස්ථාව සලස්වන්න. |
| ක්‍රියාකාරකම 02 | 2cm x 2cm කොටු ජාලයක් සහිත පත්‍රිකාවක් සකස් කර ගන්න.<br>දරුවන්ට මුද්‍රණය කිරීමට අවශ්‍ය සම්පත් ලබා දෙන්න.<br>කැමති පාටකින් එක් කොටුවක එක මුද්‍රණය බැගින් මුද්‍රණය කිරීමට අවස්ථාව සලසා දෙන්න.<br>එම මුද්‍රණ 20ක් ගණන් කර, ඒ වටා රවුම් කිරීමට යොමු කරන්න.<br>එසේ වෙනත් සීල් කරන ද්‍රව්‍ය හා පාට වෙනස් කරමින් එම ක්‍රියාවේ යොදවා 20 තෙක් ගණන් කර එය මතුකර පෙන්වන්න.<br>සිසු ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරන්න.<br>සිසු අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.<br>ඒවා අගය කරන්න.<br>සහාය අවශ්‍ය අයට නැවත නැවත සහාය ලබා දෙන්න. |
| ක්‍රියාකාරකම 03 | සිසුන් කණ්ඩායම් කරවන්න.<br>විවිධ වර්ගයේ පලතුරු මල් සත්ව රූප සහිත රූප පත්‍රිකා සපයා ගන්න.<br>එම රූප පත්‍රිකා කැමති ආකාරයට බිසිල් බෝඩ් එකේ ඇලවීමට යොමු කරන්න.<br>තම කණ්ඩායමේ ඇලවූ රූප පත්‍රිකා තමන් කැමති තැනකින් විස්සක් ගණන් කිරීමට යොමු කරන්න. |
| තක්සේරුව | නිවැරදි ව සංඛ්‍යා 20 තෙක් ගණන් කරන්නේ නම් අදාළ නිපුණතාවය දරුවා ළඟා වී ඇති බව සිසු වැඩ පොතේ සටහන් කරන්න. |

| | |
|---|---|
|  නිවසේ දී | කැමති ආකාරයට එකම රූප 25ක් අඳින්න. **24**<br><br>එයින් විස්සක් පාට කරන්න.<br><br>පාට කඩදාසිවලින් වෘත්ත 20ක් අලවන්න. |

| ක්‍රියාකාරකම අංක - 18 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | රුපියල, රුපියල් 2ක, රුපියල් 5 යන කාසි භාවිතා කර සරල ගනුදෙනු කරයි. |
| 03. ඉගෙනුම් පල | රුපියල, රුපියල් 2, රුපියල් 5 යන කාසි හඳුනා ගෙන වෙන් කර දක්වයි.<br>රුපියල් 2, රුපියල් 5 යන කාසිවලින් එක් කාසියක් භාවිතා කර සරල ගනුදෙනු සිදු කරයි. |
| 04.ඉගෙනුම් සම්පත් | දැනට භාවිතාවේ ඇති රුපියල, රුපියල් 2ක, රුපියල් 5 කාසි, අච්චු ගසන ලද කාසි කට්ටලය බැගින්, සෙල්ලම් කඩේකට අවශ්‍ය භාණ්ඩ හා ආදර්ශය, මිල පුවරු සෑදීම සඳහා සන කඩදාසි හා ඉරටු හෝ කෝටු |
| 05. ක්‍රියාවලිය<br>පියවර 01 | • සියළුම සිසුන්ට සැබෑ කාසි කට්ටලය බැගින් ලබා දෙන්න.<br>• තනි තනි ව කාසි හඳුනා ගැනීමට කාසි සමඟ සෙල්ලම් කිරීමට අවස්ථාව දෙන්න.<br>• කාසි ටින් එකකට දමා සොලවා බිමට දමා හඬට සවන්දීමට සලස්වන්න.<br>• කණ්ඩායමේ ඇති කාසි සියල්ල බිමට හලන්න.<br>• නැවත තෝරා ගන්න උපදෙස් දෙන්න.<br>• රුපියල් 2 කාසිය අච්චු ගැසීමට උපදෙස් දෙන්න.<br>• රුපියලේ කාසියක අගය සහ සිරස එක ළඟ ඇලවීමට උපදෙස් දෙන්න.<br>• ක්‍රීඩාවන්වල දී කාසිය උඩ දමමින් උඩ තිබෙන අගයන් සිරස දැයි විමසමින් සිසුන්ට ක්‍රීඩාවේ යෙදීමට යොමු කරන්න.<br>• කාසියේ වටිනාකම පිළිබඳව සිසුන්ගේ අදහස් විමසන්න. |
| | • කාසි ඇලවීම සඳහා අච්චු ගැසූ කාසි ලබාගෙන පහත ක්‍රියාකාරකමේ යොදවන්න.<br>උදා:-<br> <br>මිල දර්ශනය අනුව භාණ්ඩ මිල දී ගැනීමට සැලැස්වීම. |





- සෑම සිසුවෙකුට ම මිලදී ගත හැකි වන පරිදි සකස් කරගන්න.
- ද්‍රව්‍ය පන්තියේ පසෙක තබන්න.
- සැබෑ කාසිවලින් නැවත ද්‍රව්‍යයක් මිල දී ගැනීමට උපදෙස් දෙන්න.
- පසුව ගුරුතුමිය මුදලාලි ලෙස කටයුතු කර ද්‍රව්‍ය මිල දී ගන්නා විට කාසි නිවැරදි ව හඳුනාගෙන ඇද්දැයි පරීක්ෂා කරන්න.
- කාසි හඳුනා ගත් පසුව එක් එක් සිසුන් මුදලාලි බවට පත්කර සියලු ම ද්‍රව්‍ය මිල දී ගැනීමට අවස්ථාව දෙන්න.
- ක්‍රියාකාරකම පුරා ම ගුරුතුමිය නිරීක්ෂණය කරන්න.

- අච්චු ගසන ලද කාසිවල අගය හා සිරස පහත ආකාරයට අලවන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | 2 | 1 | සිරස | 2 | සිරස |

- කඩදාසි තීරු දෙකකින් පත්‍රිකාව වසා ඉහළින් ඇති සලකුණට ඇඟිල්ල තබන්ට පවසන්න.
- විවෘත කර බලන විට තිබෙන දෙය කිනම් කාසියේ සිරස ද? අගය ද? විමසන්න. නිවරදි ව ප්‍රකාශ කරන්නේ නම් අගයන්න.


**තක්සේරුව** — සියලු කාසි අච්චු ගසනමින් අගය ලියන්න.




- නිවසේ ද්‍රව්‍ය සපයා ගෙන නිවසේ ඇති ද්‍රව්‍ය සපයා ගෙන සෙල්ලම් කඩයක් දමන්න. නිවස සිටින සියලු දෙනා එයට සහභාගී කර ගන්න. සැබෑ කාසි හා නෝට්ටු භාවිතා කරමින් ගනුදෙනු කරන්න.

| ක්‍රියාකාරකම අංක - 19 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | උදෑසන, දහවල්, රාත්‍රී කාලය පරිසරයේ සිදුවන වෙනස්කම් සහ සිද්ධීන් ඇසුරින් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. |
| 03. ඉගෙනුම් පල | පරිසරයේ සිදුවන වෙනස්කම් ඇසුරින් උදෑසන, දහවල් හ රාත්‍රී කාලය වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. |
| 04. ඉගෙනුම් සම්පත් | උදෑසන, දහවල්, රාත්‍රී දැක්වෙන විශාල ප්‍රමාණයෙ චිත්‍ර තුනක්. |
| 05. ක්‍රියාවලිය<br>පියවර 01 | • පන්තියේ ළමුන් කණ්ඩායම් තුනකට වෙන් කරන්න.<br>• උදය, දවල් සහ රාත්‍රී කාලයේ දී රූප සහිත පින්තූර කට්ටලය බැගින් කණ්ඩායම්වලට බෙදා දෙන්න.<br>• දෙන ලද ඩිමයි කොළ භාගයක් කණ්ඩායමට ලබා දී ලැබුණු රූප කොටස් යොදාගෙන අදාළ චිත්‍රය සම්පූර්ණ කරන්න.<br><br>රූප කට්ටලය<br><br>ළා හිරු රැස් සහිත ඉර, හඳ හිරුරැස් සහිත ඉර ,හඳ<br>කන්දක රූප දෙකක්, සරුංගල් දෙකක්<br>වවුලන්, ගිරව්, වළාකුළු, තරු දෙකක්, මල් ගහක් (කන්දක රූප අලවා<br><br>ඉතිරි රූප කොටස් දී ඇති කාලයට අනුව අලවා සම්පූර්ණ කිරීමට ගුරු සහය ලබා දෙන්න.<br><br>දරුවන්ගේ චිත්‍රය පිළිබඳ ව අගය කරමින් සාකච්ඡා කරන්න.<br><br>ගුරු චිත්‍රය ඇසුරින්, උදය, දවල්, රාත්‍රී කාලය පිළිබඳව තහවුරු කරවන්න.<br><br>ගීතය ගායනා කර දරුවන් සමඟ රංගනයේ යෙදෙන්න.<br><br>කුකුල් හාමි උදෙන් ඇවිත් - හිරු කුමරා අවදි කරයි<br>නෙළුම් විලේ මල් පුබුදා - සතුට ගෙනෙනවා<br>හිරු කුමරා මුදුන් වෙලා - මුළු ලෝකෙම රත් කරලා<br>පුංචි පුතුගෙ ගතට පුංචි සිතට - වෙහෙස දැනෙනවා<br>හිරු කුමරුගේ වැඩ නිම කර - සඳ කුමරිය සනසාලා<br>හෙමින් සැරේ හිරු කුමරා - සැඟවී යනවා. |

| ක්‍රියාකාරකම අංක - 20 | |
|---|---|
| 01. කාලය | පැය 2යි. |
| 02. නිපුණතාව | සංඛ්‍යා අඩු කිරීමේ ගැටලු විසඳයි.<br>9 තෙක් වූ ද්‍රව්‍ය සංඛ්‍යාවකින් තවත් ද්‍රව්‍ය සංඛ්‍යාවක් අඩු කරයි. |
| 03. ඉගෙනුම් පල | 9 තෙක් වූ ද්‍රව්‍ය සංඛ්‍යාවකින් එයට අඩු ද්‍රව්‍ය සංඛ්‍යාවක් අඩු කළ විට ඉතුරු ද්‍රව්‍ය සංඛ්‍යාව ප්‍රකාශ කරයි.<br>9 තෙක් ද්‍රව්‍ය සංඛ්‍යාවකින් යම් ද්‍රව්‍ය සංඛ්‍යාවක් අඩු කළ විට ඉතුරු ද්‍රව්‍ය සංඛ්‍යාව ප්‍රකාශ කරයි. |
| 04. ඉගෙනුම් සම්පත් | 1 - 9 දක්වා සංඛ්‍යා පත්, අඩියක පමණ දිග කෝටු කෑලි අටක්, ගල් කැට, ඉරටු, බීම බට, ඇට වර්ග, පෑන් බට |
| 05. ක්‍රියාවලිය<br>පියවර 01 | • අපි කොළඹ යමු ද?'' ''කොහොම ද යන්නේ? මොකේ ද යන්නේ? "අපි කෝච්චියෙන් යමු. ඔයාලා කෝච්චියේ ගිහින් තියෙනවද? එන්නකෝ කෝච්චියේ යන්න.''<br>දුම්රිය නැවතුම්පොළ<br>දොර ළඟින්<br>හෝස් හෝස් කියාලා<br>වංගු වංගු වංගු හැරිලා<br>කොළඹට යනවා.....................<br>• ගායනා කර එළිමහනට දරුවන් කැඳවා ගෙන යන්න.<br>• එහි දී පෙට්ටි කිහිපයක් ඉවත් කරන බව පවසා ළමුන් කීපයක් ඉවත් කරන්න. නැවත ගමන ආරම්භ කරන්න.<br>• තුන්වන දුම්රිය නැවතුම් පොළට පැමිණීම පහදා දී පිරිසක් පෙට්ටි ලෙස සලකා ඉවත් කරන්න.<br>• මේ ආකාරයට ළමුන් 9ක් වන ලෙස ඉතිරි කර ගන්න.<br>• සියලු ම දුම්රිය පොළවල් නැවතු දරුවන් කැඳවා දැන් පෙට්ටි කීයක් තිබෙන්නේ ද? යන්න ගණන් කරන්න.<br>• ඉතිරි නව දෙනාට අඩියක් පමණ දිගින් යුතු කෝටු කැබලි අටක් ලබා දී කෝච්චි පෙට්ටි එකින් එකට සම්බන්ධ කරන්න.<br>• කෝච්චි පෙට්ටි 9න් එකක් ගලවා ඉවත් කර පෙට්ටි ගණන සංඛ්‍යාත්මක ව පෙන්වන්න.<br>• දැන් කෝච්චි පෙට්ටියෙන් 2ක් ගලවමු. දැන් කීයක් ඉතුරු ද? 9න් 2ක් ඉවත් කළ විට දැන් කීයක් ඉතුරු ද? ප්‍රශ්න කරමින් ගණන් කරන්න.<br>• 9 - 2 = 7 (සංඛ්‍යා බන්ධන ඇසුරින් පෙන්වන්න.)<br>• මේ ආකාරයට සියලු ම පෙට්ටි ගලවා ඉවත් කරන්න.<br>• මෙම සංකල්පය තහවුරු වනතුරු දරුවන් ලවා කරවන්න. |
| | • සිසුන් යුගල කරන්න.<br>• සෑම යුගලයකට ම ඉරටු, ඩින්ස් කැට, ගල් කැට, භාවිතා කරමින් පහත ක්‍රියාකාරකමේ යොදවන්න.<br>• අපි ක්‍රීඩාවක් කරමු. |

| | |
|---|---|
| | • සිසු යුගලයේ එක් එක් අයෙකු 9ට අඩු සංඛ්‍යාවක් පවසයි.<br>• අනෙක් සිසුවා ඊට අදාළ ද්‍රව්‍ය සංඛ්‍යාව වෙන් කරයි.<br>• දෙවන සිසුවා කී සංඛ්‍යාවට අඩු සංඛ්‍යාවක් පවසා වෙන්කර ගත් ද්‍රව්‍ය ප්‍රමාණයෙන් ඉවත් කරයි.<br>• දෙදෙනා ම එකතු වී ඉතිරිය සොයයි.<br>8 - 3 = 5<br>• කියන ලද සංඛ්‍යාව 9 ඉවත් කරන සංඛ්‍යාව 5<br>• මේ ආකාරයට 9 තෙක් වූ ද්‍රව්‍ය සංඛ්‍යාවකින් ඊට අඩු ද්‍රව්‍ය සංඛ්‍යාවක් ද්‍රව්‍ය අඩුකිරීමේ ක්‍රියාකාරකමෙහි යොදවන්න.<br>• දැල්ලූ ඉටිපන්දම් 8කි. ඉන් 3ක් නිවී ගියේ නම් දැල්වී ඇති ඉටිපන්දම් ගණන කීය ද? |
| තක්සේරුව | මුළු ඉටිපන්දම් ගණන, නිවී ගිය ගණන, දැල්වෙන ගණන නිවැරදි ව ප්‍රකාශ කළේ නම් අවශ්‍ය නිපුණතාවයට ළඟා වී ඇති බව තහවුරු කරන්න. |
| <br>නිවසේ දී | • පිඟන් 5ක් ගන්න. දෙකකට කෑම දැමූ පසු ඉතිරි කෑම පිඟන් ගණන කීය ද?<br>• ඇවරියක කෙසෙල් ගෙඩි නවයක් තිබුණා. එහෙයින් 9ක් කෑවා. ඉතිරි කෙසෙල් ගෙඩි ගණන කීය ද? |

අනුග්‍රහය : යුනිසෙෆ්

ඌව සහ මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ඒකාබද්ධ ව්‍යාපෘතියකි.